# පැරණි දේශීය වෛද්‍ය ශාස්ත්‍රයේ රෝග නිවාරණ ක්‍රම (දඹුල්ල තලකිරියාගම ඇතාබැඳිවැව ඩබ්ලිව් එස්. එම්. ආර්. රණසිංහ මහතාගේ පුස්කොළ පොත් එකතුව ඇසුරින් සිදු කෙරෙන ක්ෂේත්‍ර අධ්‍යයනයකි)

**ඩබ්ලිව්. එම්. හිරාන් මධුසංඛ**
පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය
සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
hiran6361@gmail.com

**සංක්ෂේපය**

ඕනෑම රටක් සතුව ස්වභාවයෙන් ම ඒ රටට ආවේනික වූ යම් ශාස්ත්‍ර විශාල ප්‍රමාණයක් පවතී. පරම්පරා ගණනාවක් තිස්සේ පූර්වකාලීනයන්ගේ අත්දැකීම් හා දැනුම මත පදනම් වෙමින් පැවත එන මේ ශාස්ත්‍ර නැවුම් දේ හා නැවුම් අත්දැකීම් සමඟින් තවත් ඉදිරියට විකාශනය වේ. එහෙයින් එය පදනම් වන්නේ ශාස්ත්‍රයට අත්‍යවශ්‍ය ම වන අත්දැකීම යන සංකල්පය ඔස්සේය. වෛද්‍ය ශාස්ත්‍රයේ මූලික ම පදනම වන්නේද එකී අත්දැකීම යන්නයි. ලංකාවේ පැරණි දේශිය වෛද්‍ය ශාස්ත්‍රය වෙත වෙනත් රටක හෝ වෙනත් ශාස්ත්‍රයකට හෝ අභියෝග කළ නොහැකි තරමේ පවතින්නාවූ විශේෂිත ශාස්ත්‍රයකි. මූලාශ්‍රය රහිත ව වුවත් එය සක්විති රාවණ යුගයට පවා දිව යන්නේ යැයි පවතින මතය වේ. නූතනත්වය හෝ තාක්ෂණයෙන් බැහැරව ස්වභාදහමත් සමග ගහට පොත්ත සේ බැඳෙමින් සිදුවන මෙහි කිසිදු අයුරකින් මිනිස් දිවියට හෝ සිරුරට අහිතකර තත්ත්ව නොමැත. රෝග නිවාරණය සඳහා ඉදිරිපත් වන්නේ අත්දැකීම් හා ශාස්ත්‍රීය ඥානයත් විවිධ වූ ස්වභාවික ඖසුත් පමණි. ඒ මඟින් එකල පැරණි සමාජයේ පැවැති ඕනෑම රෝගයක් සුවපත් කිරීමට අපේ පැරැන්නෝ අති දක්ෂයෝ වූහ. එසේම සර්වාංග වෙදකම, සර්ප වෙදකම, කැඩුම් බිඳුම් හා යන්ත්‍ර මන්ත්‍ර තවත් බොහෝ දේශීය වෛද්‍ය ශාස්ත්‍රයේ වන ඇතුල් අංග වෙයි.

විවිධ වූ රෝගයට විවිධ වූ ප්‍රතිකාර මෙන් ම කෙම් ක්‍රම යන්ත්‍ර මන්ත්‍ර මඟින් සිදු කරන්නාවූ පිළියම් විසඳුම් ද බොහෝ විය. අවට පරිසරයම භාවිත කරමින් සිදු කරන මෙම දේශීය වෙදකම මඟින් මිනිස් සිරුර කුමන හෝ ආකාරයකින් හෝ බල ගැන්වීම මිස නූතන බටහිර වෛද්‍ය ක්‍රමය මෙන් හානිදායක නොවීය. බටහිර ක්‍රමයේ මෙන් නොව මෙහිදී එක් රෝගයකට නියම වු ඖසුවක් වෙනත් ලෙසකින් සිරුරට හිතකර වේ. දේශීය ඥාන සම්භාරය තුළ ගැබ්ව පවතින මේ දේශිය වෛද්‍ය ශාස්ත්‍රය වර්තමානය වන විටදී ප්‍රයෝජනයට ගන්නේ අල්ප වශයෙනි. ඊට ප්‍රධාන ම හේතුව කාර්ය බහුල දිවියක් ගත කරන්නාවූ මිනිසා බටහිර වෛද්‍ය ක්‍රමයට ඍජුව ම හුරු වී සිටීමයි. එහෙයින් දේශිය වෙදකම පසුබා ඇත්තා සේ ම අදාළ පරම්පරාගත දැනුම ද සැඟව යමින් පවතී. (විශේෂයෙන්ම මෙහිදී සොයා ගැනීමට හැකි වූ වෛද්‍ය රහස්, වෙද ගැට, රහස් බෙහෙත්, යනාදිය) දේශිය වෛද්‍ය ශාස්ත්‍රය නැවත නඟා සිටුවීමට හෝ ඊට එළඹීමට නොහැකි නම් එකී දැනුම් සම්භාරයක උරුමකරුවන් වූ අප ඒ පිළිබඳ යමක් දැන ගැනීම හෝ අගනා කටයුත්තකි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ මෙකී පාරම්පරික දැනුම හා එකල පැවැති යම් රෝග නිවාරණ ක්‍රම පිළිබඳ එවැනි හඳුන්වාදීමක් සිදු කිරීමත් එය නූතන බටහිර වෛද්‍ය ක්‍රමය හා යම්

සැසඳීමක් සිදු කිරීමත්ය. මෙම පර්යේෂණයෙන් අතීතයේ භාවිත වූ රෝග නිවාරණ ක්‍රම, විවිධ ඖෂධ වර්ග, බෙහෙත් ක්‍රම, විවිධ රෝග ලක්ෂණ ක්‍රම රාශියක් ද රහස් බෙහෙත් ක්‍රම ද මෙහිදී සොයා ගැනීමට හැකි විය. කෙසේ වුවද මෙම ක්ෂේත්‍ර කෙරෙහි උනන්දු වන අයට එය යම් උත්තේජනයක් වීම, ඒ හරහා ඔවුන්ගේ ගවේෂණය පුළුල් වීම, එහි සාධනීය ප්‍රතිඵල වේ. මෙහි අධ්‍යයන ක්‍රමවේද ලෙසින් මූලාශ්‍රය අධ්‍යයනය (පුස්කොළපොත්) හා ක්ෂේත්‍ර ගවේෂණයත්, පාරම්පරික වෛද්‍ය ශාස්ත්‍රයේ පැතිකඩත් ඊට ආශ්‍රේය කර ගනු ලබයි.

මුඛ්‍ය පද - රෝග, දේශීය ඥාණය, වෛද්‍ය ශාස්ත්‍රය, ස්වභාදහම, බටහිර වෙදකම

**හැඳින්වීම**

විවිධ ජන සමාජ විවිධ ජන සංයුතීන් හා විවිධාකාරයේ වූ ජන කොටස්වලින් නිර්මිත වූ ලෝකයේ විවිධ රටවල් ඒ ඒ ජන සමූහයට අදාළ වූ ආවේනිකත්ව උරුම කරගෙන සිටිති. එය ඒ රටට හෝ ඒ දේශයට අදාළ වූ සංස්කෘතියයි. එසේ ම එම සංස්කෘතිය විවිධ වූ හේතු සාධකවල බලපෑම හේතුවෙන් එකිනෙකට පරස්පර වේ. ශ්‍රී ලංකාව වූ කලී එසේ අන් රටවලට වඩා සුවිශේෂී සංස්කෘකියකට උරුමකම් කියන්නා වූ රටක් හෙයින් ඒ තුළ මහා සංස්කෘති, උප සංස්කෘති මෙන් ම ඊට ආවේනික වූ ලක්ෂණ රාශියක් ප්‍රසිද්ධ හා අප්‍රසිද්ධ යන ලෙසින් පවතී. ඒ අතුරින්ද ශ්‍රී ලංකාව සතු වූ පාරම්පරික දේශීය වෛද්‍ය ශාස්ත්‍රය අන් සියල්ල්ට ම මඟ පෙන්වන්නා වූ නායකයා සේ මූලික වෙයි. එහි ආරම්භය කවදා කෙසේ කොතැනකදී සිදුවිණි දැයි නිශ්චිත ව ම පැවසිය නොහැක්කා සේ ම එහි අවසානයක් හෝ විෂය පථයේ ද නිමක් නැත. පරම්පරා ගණනක් තිස්සේ භාණක ව පැවත ගෙන ආ දේශීය වෛද්‍ය ශාස්ත්‍රය පරිපූර්ණ වූයේ අත්දැකීම් හා පාරිසරික සහයෝගීතාව හේතුවෙනි. දේශිය වෛද්‍ය ශාස්ත්‍රයේ ඇති කිසි දිනෙක ඡේදනය නොවන බැඳීම වන්නේ ද මෙයයි. එනම් අත්දැකීම් හා පරිසරය හා එය විෂයානුබද්ධ වීමයි. වෛද්‍ය ශාස්ත්‍රයේ පවත්නා හෝ නියම වන බෙහෙත් ඖෂධ සියල්ල අවට පරිසරයෙන්ම සපයා ගන්නා ඒවා වීමත් එහි සාර්ථක හා පරිපූර්ණතාව සාක්ෂාත් වන්නේ අත්දැකීම් මඟින් පමණක් ම වීම නිසාය. තවද වෙනත් කිසිඳු රටක ඇති ශාස්ත්‍රයකට හෝ ඒ සමාන වූ සංකල්පයකට මීට අභියෝග කිරීමට හෝ නොහැකි වන අතර බෞද්ධාගමික සංකල්ප මුහු වූ ආචාර ධර්ම පද්ධතියකින් එය රාමු ගත වීම මෙහි විශේෂත්වයේ එක් අංගයකි.

කෙසේ නමුත් ආරම්භයේ සිට ම විවධ ගුරු පරම්පරා හෝ විවිධ ගුරු කුල ඔස්සේ චිරාත් කාලීන ව හා අඛණ්ඩ ව පැවත ආ මෙය යම් කලෙක භාණකයෙන් මෑත් වී ලේඛණයට පැමිණියේය. එනම් පුස්කොළ පොත් මාධ්‍යය කර ගනිමිනි. එය එකලට සාර්ථක ක්‍රමයක් වූවා පමණක් නොව පසු පරම්පරා වෙනුවෙන් මහත් උපකාරී විය. ස්වභාව ධර්මයාගේ නිෂ්පාදනයක් වූ තල ගසෙන් ලබා ගන්නා මේ පුස්කොළය විවිධ පියවර රාශියකින් අනතුරුව ලිවීමේ කාර්ය සඳහා යොදා ගනී. (ඇල්ලෙපොළ,2007ඃ2) මෙම තල් කොළය වෛද්‍ය විද්‍යාවට පමණක් නොව ශල්‍යකර්මඃ සූතිකර්මඃ ගව රෝගඃ සර්ප වෙදකම් හා සියලු සර්වාංග වෙදකම්ඃ යන්ත්‍ර මන්ත්‍රඃ ආදී තවත් ශාස්ත්‍ර රාශියකට මාධ්‍ය විය. (අධ්‍යාපන සියවසඃ1969ඃ221) පුස්කොළ පොතේ විෂය ක්ෂෙත්‍රය පිළිබඳ දීර්ඝ විස්තරයක් අරිය ලගමුව මහතා තම ග්‍රන්ථයේ සඳහන් කර ඇත. (ලගමුව,2006ඃ212)

නමුත් විසි එක්වන සියවසේ මැද භාගයෙන් පසු බටහිර වෛද්‍ය විද්‍යාවත් සමඟ උදා වූ අභාග්‍ය සම්පන්න තත්ත්වයෙන් මිදීමට නොහැකි වූ කළ එතැන් සිට පුස්කොළ පොත් සංස්කෘතිය අභාග්‍ය සම්පන්න තත්ත්වයකට උරුමකම් කියමින් පවතී. නමුත් දිවයිනේ විවිධ ගුරුකුල හෝ පරම්පරා තවමත් මේ පැරණි වෛද්‍ය ශාස්ත්‍රය හා දැනුම සුරක්ෂිත කරගෙන අනාගතයට උරුමකර දීමට දරන්නා වූ උත්සාහය ප්‍රශංසනීයය. ඒ අතර දඹුල්ල තලකිරියාගම ඇතාබැඳිවැව ප්‍රදේශයේ ඩබ්ලිව් එස්. එම්. ආර්. රණසිංහ මහතා සතු පුස්කොළ පොත් එකතුවේ පවතින වෛද්‍ය ශාස්ත්‍ර කැපී පෙනෙයි. මෙම එකතුව වර්තමානයේදී වෛද්‍ය කටයුතු සඳහා භාවිත නොකරන අතර එහි භාරකරු වන්නේ රණසිංහ මහතාය. මෙම එකතුවෙහි වැදගත්කම, විශේෂත්වය හා අන්තර්ගතය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ.

පුස්කොළ පොත් 133 කට වඩා වැඩි ප්‍රමාණයක් මෙම එකතුව සතු වුවත් එහි සාර්ථක ලෙසින් අධ්‍යයනයට භාජනය කළ හැක්කේ පොත් 133 ක් පමණි. සෙසු සම්පත් කෘමින්ගේ හා විවිධ බාහිර බලපෑම් හේතුවෙන් විනාශ වී ගොස් ඇත. එසේම මෙම එකතුවේ ඇති පුස්කොළ පොත් පහත පරිදි වර්ග කළ හැකිය.

1. සර්වාංග
2. සර්ප වෙදකම්
3. කැඩුම් බිඳුම්
4. තෙල්
5. යන්ත්‍ර මන්ත්‍ර
6. සත්ත්ව වෙදකම්
7. යහන් කවි / යහන් විධි
8. නක්ෂත්‍ර හා සුබ නැකැත්

වෙනත් ස්ථානයකදී හෝ වෙනත් පුද්ගලික එකතුවක් තුළ බහුල වශයෙන් ම දක්නට ඇත්තේ එක් විෂය පරාසයක් ආවරණය වන්නා වූ පුස්කොළ පොත් රැසකි. නමුත් මෙහි විවිධ විෂයන් රැසක් ආවරණය කර තිබීම එහි සුවිශේෂිත්වය සඳහා ම එක් උදාහරණයක් සපයයි. එනම් දේශීය වෛද්‍ය ශාස්ත්‍රයේ එන ප්‍රතිකාර ක්‍රම සියල්ල ම පාහේ මෙහි අඩංගු පුස්කොළ පොත්හි අන්තර්ගත වේ. එසේ ම දෙවනුව වෛද්‍ය ශාස්ත්‍ර ක්‍රමවලින් බැහැරවී යන්ත්‍ර මන්ත්‍ර ක්‍රම සමඟින් විවිධ වූ පූජා විධි ආගමානුකූල චාරිත්‍ර කෙරෙහි ද අවධානය යොමු වූ එකතුවක් ලෙසින් මෙම එකතුව හඳුන්වාලීම සාවද්‍ය නොවේ. බොහෝ විට නොපෙනෙන ලෝකය හා සම්බන්ධ වීමට ගත් උත්සාහයක් ලෙසින් අර්ථ දැක්විය හැකිවන පරිදි නක්ෂත්‍ර හා සුබ නැකැත් පිළිබඳවත් විස්තරාත්මක සංග්‍රහයන් හමුවීම මෙහි සුවිශේෂිත්වය තව දුරටත් අරුත් ගන්වන්නකි. එසේම මෙම එකතුවෙහි හමුවන්නාවූ සෑම පුස්කොළ පොතකම වාගේ පැහැදිලි අංකනයක් දැකගත හැකිවීම තවත් සුවිශේෂී අවස්ථාවකි. පුස්කොළ පොත් අංකන රටා කිහිපයක්ම පවතින අතර මෙහිදී භාවිත කර ඇත්තේ සාමාන්‍ය අංකන ක්‍රමය හෙවත් මිශ්‍ර සිංහල හෝඩියේ භාවිතයයි. ස්වරාක්ෂර 16 හා ව්‍යංජනාක්ෂර 34 එකතුවෙන් නිර්මිත අකුරු 544 කි. (ඇල්ලෙපොළ,2007:10)

පැරණි දේශීය වෛද්‍ය ශාස්ත්‍රය මනසින් උසස් යැයි හඳුනා ගත් මිනිසාට පමණක් සීමා නොවුණි. එසේ ම එකල ගමේ වෙද මහත්මයා යයි හඳුන්වාලූ පුද්ගලයා තිරිසන් සතා කෙරෙහි ද තම ශාස්ත්‍රඥානය

මෙහෙය වූ පුද්ගලයෙකු ම විය. එවැන්නෙක් නැවතත් අපට හමුවන්නේ මෙම පුස්කොළ පොත්වල අඩංගු දේ පරීක්ෂා කිරීමේදීය. එනම් සත්ත්ව වෙදකම් විශේෂයෙන් ම ගව රෝග පිළිබඳ ව සවිස්තරාත්මක කරුණු මෙහි ඇතුලත් වේ. කෘෂිකර්මය ජීවනෝපාය කරගත් පැරණි ගැමියාගේ ස්වයංපෝෂිත ආර්ථික රටාවේ මුල් පෙළ නියෝජනයක් ගවයා සතු විය. සී සෑමේ සිට සියලු කෘෂිකාර්මික කාර්යන් සඳහා ගවයා අත්‍යවශ්‍ය ම සාධකය වූ හෙයින් උගේ පැවැත්ම කෙරෙහි මෙසේ ගැමියාගේ උනන්දුවේ එක් ප්‍රතිඵලයක් ලෙසින් ගවරෝග සඳහා ප්‍රතිකාර ක්‍රම, කෙම් ක්‍රම එදා සමාජයේ සුලබ විය.

විෂ වෙදකම හෙවත් සර්ප වෙදකම පිළිබඳ විස්මිත තොරතුරු මෙම එකතුවේ විවිධාකාරයෙන් අඩංගු වේ. කෙසේ ද යත් පැරණි වෛද්‍යාචාරීන් දෂ්ඨ කළ සර්පයා පිළිබඳ සඳහන් කළේ රෝගියා දෙස බැලීමෙන් නොව පණිවුඩය දන්වන්නට එන දූතයා දෙස බැලීමෙනි. රෝගියා ගෙන එන විටදී බොහෝ විටදී බෙහෙත් විධි නියම කොට හෝ බෙහෙත සෑදීම හෝ ආරම්භ වී ඇත. දේශීය වෙදකමේ හා වෛද්‍යාචාරීන්ගේ දක්ෂතාව නම් එයයි. එවැන්නක් පිළිබඳ මෙසේ සඳහන් වේ ඊට අනුව දූත ලක්ෂණ නම්,

> දූතයා කියා ගෙන එන හැටි බලා කියනු ෴යම් සර්පයෙක් දෂ්ට කළාය කිය කියා එන ගමන ෴තමාවට කැවී දකුණ පිටි නම් කැවේ කරවලාය ෴ ෴ මූ බැලී නම් කැවේ නාගයාය ෴ ෴ එම දූතයා නාසේ ඇල්ලී නම් කට අතිං වැසී නම් වෙදකමට නොයනු ෴ ෴ කාල දූතයයි ෴ ෴ නොයණු එම දූතයා තමාගේ බඩ ඇල්ලී නම් කැවේ පොළඟාය ෴' ෴



**සර්ප වෙදකම (රෝග ලක්ෂණ කීම) <u>WSMR 099</u>**

...පළමුවෙන් උගුර රිදෙනවා එක තැනක නොඉඳ රිංගා ඇවිදීද හැකි කැක්කුන්ද බිම අත පත ගාද වටපිට බලාද කලුපාට බඩින්යේද මේ ලකුණු වී නම් අසාද්ධයි ෴

මෙහි එන තැවිල්ලක් පිළිබඳ විස්තරයක් මෙසේය.

**<u>WSMR 021</u> තැවිලි**

නමං ශ්‍රී සණාය ෴ ඉගේ රෝගයට පිළියං විධි කියනු ලැබේ ෴ පිටිකරිං එන රදයට උකුණුවලේ නහර බොත්තමෙන් තවනු ෴ නළල වටින් එන රදයට කන් බුබුලේ තවනු ෴ ඇස පිට බැමෙන් එන රදයට දෙබැම යා වන තැනට අඟුලක් මැදට අතුරා දෙකොන දෙක තවනු ෴

දේශීය වෛද්‍ය ශාස්ත්‍රයේදී ඖෂධ විධි හෙවත් ප්‍රතිකාර විධි රාශියකි. ඒ අනුව මෙම එකතුවෙහි එම විධි ක්‍රමවලින් බෙහොමයක් අන්තර්ගතව ඇත. නමුත් වෙනත් ස්ථානයකින් හමුවන එකතුවක එසේ නොව ප්‍රතිකාර විධි කිහිපයක් හෝ අල්ප ප්‍රමාණයක් හමුවීම සාමාන්‍ය තත්ත්වයයි. මෙහි සඳහන් ඖෂධ විධි නම්,

| | |
|---|---|
| කසාය | තැම්බුම් |
| ගුල | තෙල් |
| තැවුම් | චූර්ණ |
| කැඳ | කල්ක |
| මැල්ලුම් | |
| පත්තු | බස්ම |
| ගුල්ම | |
| නස්න | |

මේ අයුරින් ම මෙහි සඳහන් වන තවත් බොහෝ බෙහෙත් විධි හා ප්‍රතිකාර ක්‍රම පහතින් දැක්වේ.

**<u>WSMR 112</u> උල්ලෝගං බස්මය**

ශරීරයේ ඇති නොයෙක් විස මර්දනයට (බෙහෝ විට ඉනාවලින් කැවුණු විස) හස්ම භාවිත කරන අතර බොහෝ විට පුහුල් හෝ ලබු සහ එම පවුලේ එල මගින් සාදා ගනු ලබයි.

**<u>කුසරාජ තෛලය</u>**


ශරීරයේ භාහිරින් එන කුෂ්ඨ ගඩු ගෙඩි වණ හෝ භගන්දරා සඳහා


මෙම පුස්කොළ පොත් එකතුවෙහි ඇති සුවිශේෂතාව හා වැදගත්කම තීව්‍ර කරන්නාවූ තවත් ප්‍රධාන සාධකයක් ලෙසින් යන්ත්‍ර මන්ත්‍ර වෙදකම් හා නිල ශාස්ත්‍ර වෙදකම හඳුන්වා දිය හැකිය. සාමාන්‍ය වෛද්‍ය ශාස්ත්‍ර තත්ත්වවලින් ඉක්ම ගිය මෙවැනි ශාස්ත්‍ර දේශීය වෙදකම සඳහා භාවිත කළ තවත් අවස්ථාවක් ලෙසින් මෙම එකතුව සැලකීම වරදක් නොවේ. එකල බොහෝ දේශීය වෛද්‍යාචාරින් වෙදකම් කළත් ගුප්ත විද්‍යා, යන්ත්‍ර මන්ත්‍ර හා නිල ශාස්ත්‍ර වෙදකම දැන සිටියේ සීමිත පිරිසකි. නිල වෙදකම පිළිබඳ එහි ඇති නිරවද්‍ය තොරතුරු මෙසේ ප්‍රසිද්ධියේ දැක්වීම අනුචිත කාර්යයක් බැවින් ව්‍යාධියකදී බෙහෙත් ප්‍රතිකාර කරන්නා වූ ස්ථාන කිහිපයකත් මෙසේ දක්වමි. මෙම සටහන සහිත පත්ඉරුව ඉහත එකතුවෙන් ලබා ගන්නා ලද සත්‍ය ඡායාරූපයකි.



**<u>WSMR 112</u> නිල වෙදකම**

එක් රෝග ව්‍යාධියක් සඳහා එක් බෙහෙත් ක්‍රමයක් නොව ක්‍රම සහ විධි කිහිපයක් දක්වා තිබීම මඟින් ශාස්ත්‍රඥයාගේ පරිපූර්ණත්වය ප්‍රකට කර ඇති බව පෙනෙයි. එනම් මෙහි ඇති එක් එක් පොතක සඳහන් වන පරිදි මීටම, මීටම යනුවෙන් සඳහන් කර එක ම රෝගයට විවිධ බෙහෙත් නියම කර ඇත. එසේ ම එම පුස්කොළ පොතෙහි රෝග රාශියකට ම පිළියම් ද දක්වා ඇත.





හෙළ වෙදකමේදී ශාස්ත්‍රය ආරක්ෂා කර ගැනීමත් ශාස්ත්‍රෝන්නතිය පිණිස ඉදිරි වැඩ සැලසීමත් වෙදහුගේ කාර්යය වෙත්. එහෙයින් ඊට අදාළ වූ යම් යම් ක්‍රම මෙහිදී භාවිත විය. ඒ අතර ගුරුන්ගෙන් පිට දීම තහනම්,..අහවලාට සත්තයි.,.බොරුවෙන් ගැනීම අගුණය.,.වට නොදෙනු පිට නොදෙනු..ගිනි වැදේ.,යනාදී අවවාදාත්මක වැකි අන්තර්ගත කර ඇත.

**නිගමනය**

එසේම මේ සම්බන්ධ තොරතුරු අති විශාල වශයෙන් සඳහන් කළ හැකි වුවත් අපසතු එකතු පිළිබඳ විස්තර සැපයීමේදී යම් යම් වාරණයන්ට යටත් වීමට සිදුවේ. එහෙයින් අදාළ කරුණු මෙසේ ලඝු කොට දක්වීම සුදුසු හා ප්‍රමාණවත් යැයි හැඟේ. අවසානයේදී නිගමනය කළ හැක්කේ මෙම එකතුව අන් එකතුන්ට වඩා සුවිශේෂී බවක් නිතැතින් ම හිමි කරගන්නා බවත් රෝග නිධානයේ සිට ලක්ෂණ, ඖෂධ සාදා ගන්නා අකාරය, පෙවීම, සුවපත් වීම යනාදී පියවර සියල්ල ම අඩංගු වන එකතුවක් ලෙසින් නම් කළ හැකිය. එසේම මෙහි අරමුණින් දැක් වූ පරිදි එනම්ල සර්වාග වෙදකමල එහි විවිධ අවස්ථාල විෂ වෙදකම සිදු කරන විවිධ ආකාර, දූත ලක්ෂණ කීම, තැවිලි, බස්ම විවිධ බෙහෙත් වර්ගල යනාදී තවත් බොහෝ රෝග නිවාරණ ක්‍රම පිළිබඳ හඳුනා ගත හැකි විය. එසේ ම රහස් බෙහෙත් ක්‍රම, කවි, වෙද ගැට, (සුද්දාගේ මාළු ගනු . සුදුලූණු) යනාදී ආවේනික ක්‍රමත් මෙහිදී දැක ගත හැකිය.

කෙසේ නමුත් වර්තමානය වන විටදී ලංකාවේ ඇති සෑම පුස්කොළ පොත් සතු දැනුම හා මෙවන් දේශිය ඥාන සම්භාරය විනාශ මුඛයට ගමන් කරමින් සිටින බව නොරහසකි. එසේ ම ඒ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය විසින් ගෙන යනු ලබන්නා වූ ව්‍යාපෘතිය යටතේ මෙම එකතුව සංරක්ෂණය කිරීමට කටයුතු යොදා ඇති බව සඳහන් කළ යුතුය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

01. ලගමුව, ආරිය, (2006), ශ්‍රී ලංකාවේ පුස්කොල පොත් ලේඛණ කලාව, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තුමේන්තුව, කොළඹ.

02. ඇල්ලෙපොල, දීපාංජනී, (2007), තල්පත් ලිවීම, මධ්‍යම සංස්කෘතික අරමුදල,සංස්කෘතික කටයුතු දෙපාර්තුමේන්තුව, කොළඹ.

03. ලංකාවේ අධ්‍යාපනය (අධ්‍යාපන සියවස ග්‍රන්ථය) අධ්‍යාපනය හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශය.

04. කුමාරස්වාමි, ආනන්ද, මධ්‍යකාලීන සිංහල කලා, කෞතුකාගාර දෙපාර්තුමේන්තුව, කොළඹ.